
ලංකාදීප
විමංසා
සාහිත්‍ය සංග්‍රහය



# ගීත නමින් දැන් ඇසෙන්නේ තුට්ටු දෙකේ යාදිනි විලාප

## ප්‍රවීණ ගීත පද රචක සිරිසමන් විජේතුංග

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂ සිරිසමන් විජේතුංග මහතා සාහිත්‍ය කලා ක්ෂේත්‍ර තුළ වඩාත් ජනප්‍රියව සිටින්නේ ගීත පද රචකයකු ලෙසය. සරසවියේදී හෙට විතරයි හමුවන්නේ, මුරගල් සෙවණේ (මහාචාර්ය සෙනරත් පරණවිතාන අනුස්මරණ ගීතය) ඇතුළු ඔහුගේ ගීත රැසක් මෙරට ගීත කලාව තුළ ජනප්‍රියවී ඇත. මහාචාර්ය සෙනරත් පරණවිතාන චරිත කතාව, වල්ලිපුරම් රන් සන්නස හා හෙළ උරුමය, සීගිරි කාශ්‍යප, රජගල තැන්න, ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන සන්නිවේදනය, අපේ උරුමය ලොවට ගෙන ගිය බෙල් ආදිය විජේතුංග මහතාගේ කෘති අතරින් කීපයක් පමණි. ඔහුගේ නවතම කෘතිය වන 'සරසවියේදී හෙට විතරයි හමුවන්නේ' ගීත සංග්‍රහය පසුගියදා එළිදැක්වුණි. මෙවර සංවාදය විජේතුංග මහතා සමග පැවැත්වෙන්නේ ඒ නිමිත්තෙනි.**

**• ගවේෂණශීලී නැඹුරුවත්, සම්ප්‍රදාය ඇසුරු කර ගනිමින් නව්‍යතාවක් මතු කිරීමත් ඔබේ ගීත රචනා එකතුවෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයක්. මේ ගීත රචනා සඳහා ඔබ පෙළඹ වූ කාරණා ගැන මුලින්ම කතා කරමු.**

මම හිතන්නෙ කවරකු වුණත් නිර්මාණ කාර්යයකට පෙළඹෙන්නේ ඔහුගේ දක්ෂතා වගේම කාලයක් තිස්සේ කරන අභ්‍යාස අධ්‍යයන ආදියේ බලපෑම් අනුවයි. මගේ ගීත රචනාවලටත් මේ තත්ත්වය බලපෑවා. අපට පාසල් වියේදී පටන් ලැබුණ භාෂා සාහිත්‍ය ඇසුර හා ගුරුවරුන් මේ නිර්මාණ ක්ෂේත්‍ර පෝෂණය කරගන්නට බලපාලා තියෙනවා. නුගමුව මහා විද්‍යාලයේ සාමාන්‍ය පෙළ පන්තියේ ඉගන ගන්න කාලෙ තමයි සිංහල භාෂාව මගේ ජනප්‍රියම විෂය වුණේ. වදකඩ මහා විද්‍යාලයේ සිංහල භාෂාව ඉගැන්වූ ප්‍රවීණ ලේඛක ආචාර්ය ජී.එස්.බී. සේනානායක ගුරුපියාණන් සහ මිල්ටන් ජේ. කුමාරනායක ගුර පියාණන් මගේ ලේඛන ජීවිතයේ වැදගත් පියවරක් වුණා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ  මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ඇතුළු බොහෝ ගුරුවරුන්ගේ ඇසුර ලේඛන කලාව කාව්‍ය රචනය වැනි අංශවලට යොමුවීමට විශේෂයෙන් බලපෑවා.

එකල ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් ආරම්භ කළ ගීත රචනා බැංකුව නිසා අප කළ නිර්මාණ ඒ  වෙත යොමු කිරීමේ අවස්ථාව ලැබුණා. ඒ ලැබුණ අවස්ථා සහ ගුරුහරුකම් නිසා තමයි ජීවිතයේ සමාජයේ විවිධ තැන් නිරීක්ෂණය කරමින් නිර්මාණ කරන්නට පසුබිම සැකසුණේ. විශේෂයෙන්ම එද පාසලෙන් අපේ භාෂා සාහිත්‍ය දැනුම පෝෂණය කළා.

**• 'සරසවියේදී හෙට විතරයි හමුවන්නේ' ඔබේ ගීතාවලියේ වඩාත් ජනප්‍රිය ගීතයක්. මේ ගීතය කොහොමද ලියැවුණේ? මේක ඔබේ අත්දැකීමක්ද?**

මේ කාරණය බොහෝ දෙනෙක් විමසන එකක්. අත්දැකීමක් කියන එක පෞද්ගලිකව හෝ පොදු සමාජයෙන් ලැබෙන්න පුළුවන්. පොත පතිනුත් ලැබෙන්න පුළුවන්. මට මේ ගීතය ගැන කියන්න කියෙන්නේ මේ සියලු කාරණා ඒ සඳහා බලපෑ බවයි.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර පඬිවරයා මගේ ගුරුවරයෙක්. මම කළ නිර්මාණ සියල්ලම වගේ එතුමාට පෙන්වන පුරුද්දක් තිබුණා. පේරාදෙණියෙන් පැමිණීමට පෙර මගේ පද්‍ය නිර්මාණ සියල්ල එතුමාට බාරදීලා ආවෙ. මාස තුනකට විතර පස්සේ එතුමා ඒ නිර්මාණ තැපෑලෙන් මට එවා තිබුණා. ඒ නිර්මාණ උසස් මට්ටමක  ඇති බවත් ඒවා පොතක් හැටියට පළ කිරීම සුදුසු බවත් එතුමා සඳහන් කළා. සරසවියේදී ගීතයත් ඒ අතර තිබුණා.

මේ ගීතය ගුවන් විදුලියේ ගීත රචනා බැංකුවට යැව්වත් අපි ගුවන්විදුලියේ අය සමග ඒ කාලෙ කිසිම දැන හැඳුනුම්කමක් තිබුණේ නෑ. 1976 දී ආචාර්ය දයාරත්න රණතුංග මහත්මා මේ ගීතය සංගීතවත් කොට ගායනා කරනතුරු මා ඒ ගැන දැන සිටියේ නෑ.

කොහොම වුණත් ගීතයක භාෂාව මම හිතන්නෙ කවියකටත් වඩා සියුම් ලෙස භාවිත කළ යුතුයි. මේ නිර්මාණවල භාෂා භාවිතයේ යෝග්‍යතා ගලපා ගන්නට ගුරුවරුන් අපට ලබාදුන් භාෂා ඥානයත් හෙළ හවුලේ ඇසුරත් බලපාන්නට ඇති.




**• අද්‍යතන යුගයේ බිහිවන බොහෝ කවි වියළි ඇටසැකිලි කවි  බවත් පද්‍ය සාහිත්‍යයේ මේ පරිහානිය ගීත සාහිත්‍යයට සෘජුවම බලපා ඇති බවත් ප්‍රවීණ ගීත රචක සුනිල් සරත් පෙරේරා මහතා සඳහන් කරනවා. මේ මතය ඔබ  පිළිගන්නවාද?**

ඒ කතාව ඇත්තක්. මීට හේතුවී ඇත්තේ භාෂා සාහිත්‍යය අධ්‍යයනය නිසි පරිදි සිදු නොවීම කියලයි මම හිතන්නේ. අද වනවිට භාෂා සාහිත්‍ය විෂයයන් පාසල් විෂය මාලාව තුළ හරියාකාරව අධ්‍යයනය කරන්න ලැබෙනවාද කියන එක ගැටලුවක්. මේක ගුරුවරුන්ගේ වරදක් නොවෙන්න පුළුවන්. සමහර ප්‍රතිපත්ති තීන්දු නිසා ඇතිවුණ අර්බුදයක් මේක. සමහර කාලවල සාහිත්‍යය  වගේ විෂයයන් නොතකා හැරි අවස්ථා ගැන අපට අසන්නට ලැබුණා. දැන් මේ අපි දකින්නේ ඒවායේ ප්‍රතිඵල. සාහිත්‍යය කරලා කාර් එකක්වත් ගන්න පුළුවන්ද කියලා ඇතැම් දේශපාලකයන් ප්‍රශ්න කරන තැනට මේ විෂය අවප්‍රමාණයට ලක්කොට තිබුණා.

හැබැයි අපි පාසල් යන කාලෙ අපට භාෂා සාහිත්‍යය විෂයන් කෙරෙහි ඇතිවුණ ඇල්ම තමයි සමස්ත ජීවිතයටම බලපෑවේ. ඒ තත්ත්වය අද දරුවන්ට නොලැබීම අවාසනාවක්. මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස වැනි පඬිවරුන්ගේ නිර්මාණ පාසල් කාලයේදී අපට වඩාත් සමීප වුණා. මම හිතන්නෙ ඒ නිර්මාණ එද වගේම අදටත් වලංගුයි. මම හිතන්නෙ පාසල් විෂය නිර්දේශ සැකසීමේදී භාෂා සාහිත්‍ය කෙරෙහි වැඩි අවධානයක් ඉදිරියේදී යොමු නොකළොත් ලොකු සමාජ අර්බුදයකට මුහුණපාන්නට අපට සිදුවෙනවා.

මේ අර්බුදයම තමයි වර්තමාන ගීතයටත් බලපාල තියෙන්නේ. මූලිකම දේ නූතන රචකයන්ට ප්‍රබුද්ධ භාෂා දැනුමක් නෑ. ඒ නිසා දුර්වල පද රචනා ලියැවෙනවා. එද ඩෝල්ටන් අල්විස්, චන්ද්‍රරත්න මානවසිංහ, සුනිල් සරත් පෙරේරා වගේ ගීත රචකයන්ගේ නිර්මාණවල මොනතරම් සාහිත්‍යමය රසයක් තියෙනවද? බලන්න. ඒ සඳහා ඔවුන්ට බලපෑවෙ භාෂා සාහිත්‍ය දැනුම සහ ඔවුන් තුළ පැවැති උසස් රසවින්දන ඥානයයි.

**• ගීතයක භාෂා විචිත්‍රත්වය ඒ ගීතයේ පැවැත්මට බලපාන බවයි ඔබේ අදහසින් වැටහෙන්නේ. නූතනයේ අපට ඇසෙන බොහෝ ගීතවල ඇති පිරිහුණ භාෂා භාවිතය දකින විට ගීතයේ අනාගතය ගැන මොකද හිතෙන්නෙ?**

වර්තමානයේ අතරින් පතර හොඳ ගීත බිහිවන බව අප පිළිගත යුතු  වුණත් ඒවා සමාජගත වන්නේ නැති තරම්. ඒක කනගාටුවට කරුණක්. ඉස්සර නම් බස් රථවල ගමන් කරන විට මගීන් අත පොතක් පතක් හෝ සඟරාවක් දකින්නට ලැබුණා. ඒත් අද පරම්පරාව කන් දෙකට ඇබ ගහගෙන ජංගම දුරකථනවල එල්ලිලා මොනවා හෝ අසමින් බලමින් යනවා දකින්න පුළුවන්. ඊටත් වඩා බොහෝ බස් රථවල පොදුජන රසිකත්වයට දැඩි බලපෑම් කරන කාරණයක් තිබෙනවා.

ඒ තමයි මේ බස් රථවල ඉතාම අස්ලීල ගීත ප්‍රචාරය කිරීම. ඇත්තටම ඒවා ගීත නොවෙයි. මේවා හුදු විලාප නැඟීම් කෑ ගැසීම් පමණයි. ඔක්කාරය හැදිල වගේ ඔහේ කෑ ගහනවා. බස් රථවල ගමන් කරන මගී ජනතාවගේ නිදහසට රසිකත්වයට හානි කරන මෙවැනි අවස්ථා නියාමනය කළ යුතුයි.

පොදු සමාජයෙන් මේ පෙන්වන්නේ මොකක්ද? මීට අවුරුදු විස්සකට විතර කලින් සාහිත්‍යය ඉතිහාසය වගේ විෂයයන් පන්ති කාමරයෙන් පළවාහැරීමේ විපාකයි. තාක්ෂණය අවශ්‍ය බව ඇත්ත. ඒත් අපේ රටේ බොහෝ දෙනා තාක්ෂණය යොදාගෙන තිබෙන්නේ පාරිහානිය දක්වා යාමට බවයි පෙනෙන්නේ. තුට්ටුදෙකේ යාදිනි විලාප ගීත නමින් මේ කාලෙ ඇහෙන්නෙ ඒකයි. තාක්ෂණය තිබුණාම හැමදේම කරන්න පුළුවන් කියලයි ඒ අය හිතන්නෙ. මේවා අහන්න බැරිව මම බස්වලින් බැහැල ආපු වාර අනන්තයි.

**• මෙයින් පැහැදිලි වන්නේ වර්තමානයේ බොහෝ දෙනා ගීතයක ඇති කලාත්මක අගය හඳුනානොගෙන නිර්මාණ රචනයේ යෙදෙන බවයි. ගීතය නමැති කලාංගයේ ඇති විශේෂත්වය ඔබ නවකයන්ට කියා දෙන්නේ කොහොමද?**

'ගී' යන වචනය පැරැණි සාහිත්‍යයේ සසදාවත, මුවදෙව්දාවත වගේ නිර්මාණවලදී හමුවුණත් ඒ වර්තමානයේ කියැවෙන 'ගීතය' නමැති අරුතින් නොවෙයි.

ගීතය මූලිකවම තුන් දෙනකුගේ සම්මාදමක්. පද රචකයා, සංගීතඥයා හා ගායකයා ඊට මනා සාධාරණයක් ඉටු කළ යුතුයි. කවියක් නම් පොතකින් කියවලා රසවිඳින්න පුළුවන්. ඒ රචනයට සීමා පනවලා නෑ. ඒත් ගීතයක ජීවය රැඳිල තියෙන්නෙ විනාඩි තුනක් හෝ හතරක කාලයක් තුළයි. ගීතය ගැයෙන විට එය අසා රසවිඳීමේ ශක්තිය හා සංයමය අපට තියෙන්න ඕනෑ.

අතීතයේ ගායනා වූ ගීතවල යම් ලාලිත්‍යයක් ලතාවක් තිබුණා. එහි යම් සංයමයක් තිබුණා. ඒත් අද නැටිල්ල නැත්නම් ගායකයට ගීතය ගයන්න බෑ. අන්තිමට නටනව විතරයි සින්දුවක් නෑ. උඩ පැන පැන නට නටා කොහොමද ගීතයට සාධාරණයක් කරන්නෙ. කොහොමින් හරි සාහිත්‍ය කලාව පිරිහීම තුළ භාෂාවේ පිරිහීම දකින්නට ලැබෙනවා. භාෂාව කෙළෙසූ විට ජාතිය විනාශ වී යන බව විද්වතුන් පෙන්වා දී තිබෙනවා.

සංවාද සටහන
ගාමිණී කන්දේපොළ

ඡායාරූපය: ළහිරු හර්ෂණ